සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පරිවාස/වැඩ බලන සහකාර පොලිස් අධිකාරිවරුන්/වරියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2017 (I) (2019)

**(80) මූලික අයිතිවාසිකම්, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** රටේ පරම නීතියේ කොඳු නාරටිය වන ව්‍යවස්ථාව මගින් රටෙහි වාසය කරන තැනැත්තන්ගේ අයිතිවාසිකම්, නිදහස සහ ස්වාධීනත්වය ආරක්ෂා කරන ආකාරය 1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **'මූලික අයිතිවාසිකම්'** පිළිබඳ විධිවිධාන යටතේ සාකච්ඡා කරන්න. *(ලකුණු 16 යි)*

**2.** කොළඹ මහාධිකරණයේ දී 2018 ක් වූ අප්‍රේල් මස 07 වන දින චණ්ඩු, රශ්මි සහ බාලන් විසින් රාජිනී සමූහ දූෂණය කළ බවට අධිචෝදනා ලබා සිටිති.

පහත දැක්වෙන සාක්ෂීන්, සාක්ෂි ආඥා පනතේ කුමන වගන්ති යටතේ අනුකූල වී ඒ අනුව ආවේශ්‍ය වේ දැයි සාකච්ඡා කරන්න. (නඩු තීන්දු අනවශ්‍යයි)

(i) අපරාධ ස්ථානය අසලින් යමින් සිටි සාක්ෂිකාර ශයාන්ට, විත්තිකාර චණ්ඩු විසින් 'බාලන් රාජිනී ව අල්ලාගන්න' කියා කෑගසනු ඇසුණි.

(ii) දූෂණය සිදු වී දින දහයකට පසු ව රාජිනී ලිංගික සංක්‍රමණික රෝගයකින් පෙලෙන බව හඳුනා ගනී. පැමිණිලි පක්ෂය විසින් විත්තිකාර බාලන් සිද්ධිය සිදු වූ අවස්ථාවේ එවැනි රෝගයෙන් පෙලුනු බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.

(iii) දූෂණයට භාජනය වූ රාජිනීට විත්තිකාර චණ්ඩු සිය ආදරය හා ස්නේහය සටහන් කරමින් ඇය වෙත ලිපි යවා ඇති අතර, ඇය එය ප්‍රතික්ෂේප කර ඔහුට දොස් පවරා ඇත.

(iv) විත්තිකාර රශ්මි සිද්ධිය වූවාට පසු ව තම මිතුරු ශන්කර්ට සිද්ධිය සම්පූර්ණයෙන් පවසයි. පැමිණිල්ල ශන්කර්ගෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.

*(ලකුණු 03 × 4 = 12 යි)*

**3.** "විත්තිකරුවකුගේ චරිතය පිළිබඳ සාක්ෂි අධිකරණයේ මෙහෙයවීමේ දී සීමාවන්ට ලක් වේ." නෛතික විධිවිධාන පැහැදිලි කරන්න. (නඩු තීන්දු අනවශ්‍යයි) *(ලකුණු 12 යි)*

**4.** "සියලු ම පූර්ව නිගමන බිඳ හෙළිය හැකි ය." සාක්ෂි ආඥා පනතේ විධිවිධාන ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 12 යි)*

**5.** මහේස්ත්‍රාත් අධිකරණයක නඩු ආරම්භ කළ හැකි ආකාරයන් ලැයිස්තු ගත කරන්න. *(ලකුණු 12 යි)*

**6.** (i) මහාධිකරණ නඩු විභාගයක දී ජූරි සභාවක් තෝරා ගැනීමට අවස්ථාවක් ලබා දීම අත්‍යවශ්‍ය වන්නේ කුමන අවස්ථාවක දී ද?

(ii) ජූරි සභාවක් සහිත නඩු විභාගයක දී දිය හැකි වලංගු තීරණ මොනවා ද?

*(ලකුණු 06 × 2 = 12 යි)*

**7.** "එකිනෙකට වෙනස් වැරදි කිහිපයක් එකම චෝදනා පත්‍රයක් හෝ අධිචෝදනා පත්‍රයක් මත එක්කර පවරා පවත්වා ගෙන යා හැකි ය." චෝදනා එක් කිරීමට **පමණක්** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන සාකච්ඡා කරන්න. *(ලකුණු 12 යි)*

[ 2 වන පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**8.** පහත මාතෘකා හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) අපරාධ අධිකරණයක් විසින් සිතාසි භාර දෙන්නේ කෙසේ ද?

(ii) අත්හිට වූ සිරදඬුවම් පැනවිය හැකි අවස්ථා

(iii) මහේස්ත්‍රාත් අධිකරණයේ විත්තිකරු නොමැතිව නඩු විභාග කිරීම

(iv) සාක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය බලපවත්වන අවස්ථා

(v) තමන්ගේම ප්‍රකාශ භාවිත කරමින් සාක්ෂිකරුගේ විශ්වාසනීයත්වය බිඳ හෙළීම

(vi) සාක්ෂිකරුවකුගේ මතකය අලුත් කිරීම

*(ලකුණු 03 × 4 = 12 යි)*

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පරිවාස/වැඩ බලන සහකාර පොලිස් අධිකාරිවරුන්/වරියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2017 (I) (2019)

**(81) දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥා පනත**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති ආකාරයට පහත සඳහන් දෑ කෙටියෙන් අර්ථ දක්වන්න.

(i) අයුතු ලාභය (Wrongful Gain)

(ii) වංචනික ලෙස (Fraudulently)

(iii) චංචල දේපළ (Movable Property)

(iv) තුවාල සිදු කිරීම (Causing Hurt)

(v) මහජන පීඩාව (මහජන කරදරය) (Public Nuisance)

*(ලකුණු 03 × 5 = 15 යි)*

**2.** දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව,

(i) 'සොරකම' යන වරද සඳහා සම්පූර්ණ විය යුතු කරුණු මොනවා ද? *(ලකුණු 05 යි)*

(ii) 'බලෙන් ලබා ගැනීම' යන්න නිර්වචනය කරන්න. *(ලකුණු 05 යි)*

(iii) සොරකම සහ බලෙන් ලබා ගැනීම කොල්ලකෑමක් බවට පත්වන අවස්ථා පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) දයානන්ද නමැති තැනැත්තා මීට දින ගණනකට පෙර සිරිල් සමග කෝලාහලයක පැටලුණු අතර ඔහුගෙන් පළිගැනීමට අවස්ථාවක් එන තුරු බලා සිටියේ ය. හිරු බැස යන යාමයේ ගමේ මංසන්ධියට රැස් වූ පිරිස අතර සිරිල් සිටින බව දයානන්දට දැනගන්නට ලැබුණි. දයානන්ද වේගයෙන් පිරිස ඉදිරියට කඩා පැන තමා අත තිබූ තුවක්කුවෙන් රැස් ව සිටි පිරිස දෙසට එල්ල කොට වෙඩි තැබුවේ ය. ඔහුගේ අරමුණ වූයේ සිරිල් මරා දැමීම ය. කෙසේ වුවත් ඉලක්කය වැරදී පිරිස මැද සිටි ජයන්තට එකී වෙඩි පහර වැදී එතැන ම මැරී වැටුණි. දයානන්දගේ අපරාධ වගකීම දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව විමසන්න. *(ලකුණු 05 යි)*

(ii) මියගිය ජයන්ත එම අවස්ථාවේ දී බීමත් ව සිටියේ නම් දයානන්දගේ අපරාධ වගකීමේ වෙනසක් සිදු වේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iii) වෙඩි පහරින් මිය ගිය ජයන්ත ඉන් පසු දින දෙකක්වත් ජීවත් නොවන තරමේ තදබල අසාධ්‍ය ක්ෂය රෝගය තත්ත්වයකින් සිටි අයෙකු නම් දයානන්දගේ අපරාධ වගකීමේ වෙනසක් සිදු වේ දැයි පැහැදිලි කරන්න. (වෙඩි පහරින් මිය නොගියේ වුව ද නිසැක ව ම දින දෙකකින් ක්ෂය රෝගය උත්සන්න වී ජයන්ත මිය යන බව වෛද්‍යවරුන් ප්‍රකාශ කොට ඇතැයි සිතන්න.) *(ලකුණු 05 යි)*

**4.** (i) සිරිසේන නමැත්තා පොල් වත්තක මුරකරුවකු ලෙස සේවය කරයි. ඔහු වත්තේ ඇවිදිමින් සිටින විට පොල් ගෙඩි කඩා සොරෙන් ගෙන යාමේ අරමුණෙන් පොල් ගසක් මුදුනේ කිසිවකු සිටිනු දකී. සිරිසේන දුටු සොරා වහ වහා ගසින් බැස දිව යද්දී පසු පසින් ලුහුබැඳ ගොස් තමා අත තිබූ තුවක්කුවෙන් වෙඩි තබා සොරා මරා දමයි. සිරිසේනගේ අපරාධ වරද සම්බන්ධයෙන් යොදා ගත හැකි විත්තිවාචක ඇත්දැයි සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි)*

(ii) සිරිසේන වෙඩි තැබුවේ සොරා ගසෙන් බැස තමා වෙතට අනින්නට පිහියක් අමෝරා ගෙන එද්දී නම්, ඔබගේ පිළිතුර එය ම වේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 2 වන පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**5.** මහජන පීඩා වැළැක්වීමට ක්‍රියා කිරීම සඳහා පොලිස් නිලධාරීන්ට පොලිස් ආඥා පනතින් සලසා දී ඇති විධිවිධාන සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි)*

**6.** පොලිස් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර ව පෙරහර සහ පෙළපාළි තහනම් කිරීමට හෝ නියාමනය කිරීමට පොලිස් නිලධාරීන් සතු වන බලතල සහ ඔවුන්ගේ කාර්යභාරය විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**7.** පොලිස් ආඥා පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාර ව පහත සඳහන් කරුණු පිළිබඳ සටහන් ලියන්න.

(i) පොලිස් නිල ඇඳුම් අවභාවිත කිරීම

(ii) පොලිස් නිලධරයකු සේවයෙන් ඉල්ලා අස්වීම

*(ලකුණු 10 යි)*

**8.** මහජන යහපත සඳහා අයාලේ යන ගවයන් පිළිබඳ රාජකාරි ඉටු කිරීම උදෙසා පොලිස් නිලධාරීන්ට පොලිස් ආඥා පනතේ දක්වා ඇති විධිවිධාන පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

***

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka